වරකාපොල ප්‍රාදේශීය සභාව,
කෑගල්ල දිස්ත්‍රික්කය
......................................

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 01 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 03 සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට වරකාපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.
-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අරමුදල් ප්‍රභවයන් 03 ක් යටතේ කර්මාන්ත 86 ක් සිදු කිරීම සඳහා ලද එකතුව රු. 24,982,875 ක් වූ ප්‍රාග්ධන ආධාර මුදල් හා එමගින් කරනු ලැබූ වැය කිරීම් පොදු තැන්පත් ගිණුම මගින් ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර හා ප්‍රාග්ධන වියදම් එකී ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ආ) ඉදිරි වර්ෂය වෙනුවෙන් ලද රු. 100,664 ක වරිපනම් බදු ආදායම හා රු.1,604 ක අක්කර බදු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා වර්ෂයේ අවසාන දිනට කලින් ලද ආදායම් රු.102,268 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළින් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලයට අදාල රු.12,207 ක් වූ උසාවි දඩ දිරි දීමනා වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සිදු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා වර්ෂයේ අවසන් දිනට ණයහිමියන්ගේ වටිනාකම රු.12,207 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය සඳහා උසාවි දඩ ආදායම් රු.501,213 ක් හා මුද්දර ගාස්තු ආදායම් රු. 205,949 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීම නිසා වර්ෂයේ අවසන් දිනට සමුච්චිත අරමුදල් ගිණුම් හා ආදායම් ණයගැතියන්ගේ වටිනාකම රු. 707,162 ක් බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන තුළින් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාලව ඉඩම් ඔප්පු 1,143 ක් වෙනුවෙන් දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ටාර්වරයාට ගෙවිය යුතු දිරි දීමනා රු.28,575 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සිදු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා වර්ෂයේ අවසන් දිනට ණයහිමියන්ගේ වටිනාකම රු.28,575 බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළින් දක්වා තිබුණි.

(ඊ) වරකාපොල සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2014 ඔක්තෝබර් 30 දින සිට මාසික ණය වාරික 180 න් ගෙවීමේ පදනම මත දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබූ රු. 13,720,021 ක මුදල හා රු.307,882 ක් හිඟ පොලී මුදල බැරකම් යටතේ දක්වා නොතිබුණි.

(උ) රු.42,670,273 ක් වැය කර 2012 වර්ෂයේදී ඉදිකර තිබූ සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙහි වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් අක්කර 03 රූඩ් 03 ක් වූ ඉඩම් කොටස් 07 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වත්කම්වල අගය නිවැරදිව ගිණුම් මඟින් අනාවරණය වී නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු. 795,310 ක් වුවත් එය රු.931,091 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ පොලී ආදායම හා වර්ෂය අවසාන දිනට ස්ථාවර තැන්පත් වටිනාකම රු.135,781 බැගින් වැඩියෙන් ගිණුම් මඟින් දක්වා තිබුණි.

(ඒ) දැදිගම,වරකාපොල,මායින්නොලුව හා අල්ගම යන පුස්තකාල සඳහා පරිත්‍යාග වශයෙන් ලැබීතිබූ පොත්වල පරිත්‍යාග වටිනාකම රු.95,474 ක් වුවත් , මුල්‍ය ප්‍රකාශන වල එය රු.115,681 ක් ලෙසට දැක්වීම හේතුවෙන් රු.20,207 ක ආදායම් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුන පාලන ගිණුම්

------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 06 කට අදාල මුල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.40,943,801 ක් වූ අතර, ඊට අදාල උපයෝගී ලේඛන/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.74,516,186 ක් වූයෙන් වෙනස රු.43,572,385 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.29,037,327 ක් වූ අතර, එයින් රු.19,586,048 ක් වසරකට වඩා පැරණි විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.20,087,857 ක් වූ අතර , එයින් රු.5,451,331 ක් වසරකට වඩා පැරණි විය.

1.3.4 නීති රීති ,රෙගුලාසි වලට අනුකූල නොවීම.

---------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ <u>තීරණවලට යොමුව</u> | | <u>අනුකූල නොවීම්.</u> |
|---|---|---|
| (අ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මු(ඇ) (2) 371.රෙ. | - | අවස්ථා 20 කදී තත්කාර්ය අතුරු අග්‍රිම වශයෙන් ලබාගත් මුදල් වලින් ඉතිරි මුදල් වන රු. 425,000 ක් යොමු ගත රෙගුලාසිය ප්‍රකාර පියවා නොතිබුණි. |
| (ii) මු(3) 571 .රෙ. | | 2011 දෙසැම්බර් 31 දින වන විටත් වර්ෂ 02 ක් ඉක්මවූ වටිනාකම රු.5,348,863 කට තැන්පත් ශේෂ 592 ක් නියාදනය කිරිමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය xxiv වන පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්ති | - | 1988 වර්ෂයේ සිට පැවත එන ස්ථාන මාරුවීම් ලබාගිය නිලධාරින් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු.137,660 ක සේවක ණය මුදල් අයකර ගෙන නොතිබුණි. |
| (ඇ) සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ 2005 ජුනි 01 දිනැති අංක 2005/14 දරන චක්‍ර ලේඛය 3(ii) කොන්දේසිය | - | සභා බල ප්‍රදේශය තුළ පර්චස් 10 බැගින් ඉඩම් කැබලි 09 ක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ඇති අතර, විකුණනු ලබන ඉඩම් කට්ටි වල වටිනාකම් මත 1% ක බදු මුදල සභාවට නොගෙවීම සම්බන්ධව නීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ 261.2.2 රීතිය | - | රු.100,000 ක් ඉක්මවා අවස්ථා දෙකක දී අතුරු අග්‍රිම වශයෙන් රු.350,000 ක මුදලක් ලබා දී තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල.

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,075,413 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,425,305 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.349,892 ක පිරිහීමක් දක්නට ලැබුණි.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

----------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | | | | | | 2014.12.31 දිනට හිගය |
|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | 2014.01.01 දිනට හිගය | 2014.12.31 දිනට හිගයෙන් අයකිරීම | 2014 වර්ෂයේ බිල් කිරීම් | වර්ෂයේබිල් කිරීම්වලින් අයවීම | 2014.01.01 දිනට පැවති හිගයෙන් | වර්ෂයේ බිල් කිරීම් වලින් හිගය | මුළු හිගය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i වරිපනම් හා බදු | 7,754,942 | 2,102,397 | 5,531,828 | 2,361,179 | 5,652,545 | 3,170,649 | 8,823,194 |
| ii බදු කුලී | 204,235 | 71,988 | 3,452,860 | 3,383,624 | 132,247 | 69,236 | 201,483 |
| iii බලපත්‍ර ගාස්තු | - | - | 750,000 | 778,550 | - | ( 28,550) | (28,550) |
| ivවෙනත් ආදායම් | 18,510,761 | 4,709,504 | 57,040,214 | 51,265,451 | 13,801,257 | 5,774,763 | 19,576,020 |

2.2.2 වරිපනම් බදු

----------------

වර්ෂ 05 කට වරක් වරිපනම් බදු තක්සේරුවක් සිදු කළ යුතු වුවත් 2008 වර්ෂයේ තක්සේරුව පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂය සඳහා ද වරිපනම් බදු අයකරමින් පැවතුණි.

2.2.3 බලපත්‍ර ගාස්තු

---------------

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/8 දරන ගැසට් නිවේදනයේ iii වන උපලේඛනයේ දැක්වෙන පරිදි සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 17 ක් වෙනුවෙන් පාරිසරික බලපත්‍ර ලබා නොගැනීම මත සභාවට රු.76,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

2.2.4 වෙනත් ආදායම්

-------------------

(අ) 2014 ඔක්තොම්බර් 21 දින භෞතික විගණන පරික්ෂාවේ දී ස්ථිර හා තාවකාලික දැන්වීම් පුවරු 11 ක් සවිකර තිබූ බවට හඳුනා ගන්නා ලදි. එම දැන්වීම් පුවරු වලින් රු.70,655 ක ගාස්තුවක් අයකරගෙන නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ වතුහිමියන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.885,119 ක අක්කර බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ ආදායම රු.1,814,963 ක් හා මුද්දර ගාස්තු ආදායම 10,283,965 ක් විය.

2.3 අධිභාර

------------

නීති රීති වලට පටහැනිව නිවාස දුරකථනයක් සවිකිරීම වෙනුවෙන් 2012 වර්ෂයේදී රු.14,694 ක මුදලක් වෙනුවෙන් අධිභාර සහතිකයක් නිකුත් කිරීමට නියමිතව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

(අ) වරකාපොල මහජන බැංකුව පවත්වාගෙන යනු ලබන අංක 054-1-001-1-7380404 දරන බැංකු ජංගම ගිණුමට අදාලව 2013 ඔක්තෝබර් මාසයේ සිට තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවී පවතින වටිනාකම රු.10,646 ක් වන චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් සොයා බලා එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සබරගමුව පළාත් සභාවෙන් ලබා දී තිබූ වාහන 07 ක අයිතිය ප්‍රාදේශීය සභාව නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කළ ව්‍යාපෘති 12 ක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබූ අතර, ඒ සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන එකතුව රු.2,850,000 ක් විය.

(ආ) 2012 වර්ෂයේදී කට්ටි කර විකුණනු ලැබූ ඉඩමක් සම්බන්ධයෙන් සභාවේ පොදු කටයුතු සඳහා ලබාදෙන ලද පර්චස් 106.5 ක භූමි භාගය වැටවල් ගසා ආරක්ෂිත ලෙස වෙන්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු

-----------------------

ආදාහනාගාරයේ ප්‍රයෝජනය සඳහා රු.1,209,600 කට මිලදී ගන්නා ලද විදුලි ජනක යන්ත්‍රයට අදාලව තාක්ෂණික ඇගයීම් වාර්තාවක් ලබාගෙන නොතිබූ අතර විදුලි ජනක යන්ත්‍රය වෙනුවෙන් සැපයුම් ආයතනය සමඟ සේවා ගිවිසුමකට ද එළඹ නොතිබුණි.

2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත යටතේ ලියාපදිංචි නොවූ සැපයුම් කරුවෙකුගෙන් මිලට ගන්නා ලද ඉහත සඳහන් විදුලි ජනක යන්ත්‍රය සඳහා රු.129,600 ක එකතු කළ අගය මත බදු මුදල ගෙවා තිබුණි.

3.4 ඌන උපයෝජිත වත්කම්

-------------------------------

සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ට සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම් සැපයීමේ අරමුණ ඇතිව ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර ක්‍රමය යටතේ රු.42,670,273 ක් වැය කර 2013 වර්ෂයේදී වැඩ නිමකර තිබූ ගොඩනැගිල්ල අපේක්ෂිත අරමුණ වෙනුවෙන් යොදා නොගෙන සභා රැස්වීම් ශාලාවක් ලෙසට භාවිතා කරමින් පැවතුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලන

-------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන වෙන්කර තිබුණු වැඩ විෂයන් 09 ක එකතුව රු.1,645,000 ක ප්‍රතිපාදන 100% ක් ද වැඩ විෂයන් 06 ක එකතුව රු.556,147 ක ප්‍රතිපාදන වලින් 55% ත් 97% ත් අතර ද වශයෙන් එකතුව රු. 2,201,147 ක් සභා කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

(ආ) වැය විෂයන් 05 ක අනුමත ඇස්තමේන්තු ඉක්මවා රු.503,154 ක් වැය කර තිබුණි.මේ හේතුවෙන් අය වැය ලේඛනය සපලදායී මූල්‍ය පාලන ඒකකයක් වශයෙන් යෙදා ගෙන නොතිබිණි.

4.2 නොවිසඳී ඇති පිළිතුරු නොදුන් විගණන විමසුම්

-------------------------------------------------------

2015 ජූලි 10 දින වන විට විගණන විමසුම් 02 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර , එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළහැකි ගනුදෙනු වල වටිනාකම රු.851,000 ක් විය.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) අයවැය පාලනය

(ඈ) ආදායම් පරිපාලනය

(ඉ) වත්කම් කළමනාකරණය